# පිරිවෙන් අධ්‍යාපනය කෙසේ සකස් විය යුතු ද?

**මැදගොඩ සුමනතිස්ස නාහිමිපාණන් වහන්සේ**

පිරිවෙන් අධ්‍යාපනය උදෙසා ඇති ව්‍යවස්ථා, පණත්, නියෝග, පරිපාලනය, අධ්‍යාපනයේ ස්වභාවය හා පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රතිඵල නිතර විවේචනයට හා අප්‍රසාදයට භාජනවීමෙන් හා ඉතා විරළ අගය කිරීමක් දක්නට ලැබීමෙන් පෙනීයන්නේ පිරිවෙන් අධ්‍යාපනයේ ඇති ගැටළු ස්වභාවයයි. එසේම කිසියම් නිශ්චිත පරමාර්ථ කීපයක් **පදනම්** කොටගෙන කාලීන පිරිවෙන් අධ්‍යාපන පරිපාටියක් සකස්කර ගැනීම අරබයා උගතුන්ගේ හා අත්දැකීම් ඇති වග කිවයුත්තන්ගේ නොමඳ උත්සාහය තව දුරටත් යෙදිය යුතු බව කිවහැකිය.

පිරිවෙන් අධ්‍යාපනය දැඩි විවේචනයට බඳුන්වීමට එක් හේතුවක් වශයෙන් සැල කියහැක්කේ නිරන්තර අභියෝගයන්ට භාජන වන පැරණි සනාතන ඇගයීම් පදනම් කොටගෙන පිරිවෙන් අධ්‍යාපනය ගොඩනගා තිබීම යයි සිතිය හැකිය. සනාතන ඇගයීම් අර්ථවත් කර සමාජ පෝෂණය සඳහා පිරිවෙන් අධ්‍යාපනය යොදගත යුතුයයි පිරිසක් තර්ක කරණ අතර තවත් පිරිසක් සියලු ඇගයීම් නවීකරණය කිරීම හා විද්‍යා තාක්ෂණ ප්‍රවාහය තුළින් එන දැනුම් සම්භාරය හා ප්‍රායෝගිකත්වය පිරිවෙන් අධ්‍යාපනයටද අදල කරගතයුතුයයි තර්කකරති. නිදසුනක් වශයෙන් ගතහොත් උගත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අනුග්‍රහය ඇතිව දැනට අමරිකාවේදී පාලි ත්‍රිපිටකය පරිගණක (කොම්පියුටර්) ගත කරමින් පවතී. ලංඩනයේ පාලිපොත් සමාගම මෙම පරිගණක ගත කිරීමේ වැඩමාලාවට ඇතුළත් නොවූයේ වෙනත් හේතුවක් නිසයි.

ලංකාවේද සිංහල අකුරෙන් ත්‍රිපිටකය පරිගණක කළහැකියයි ජනමාධ්‍ය මගින් මෑතකදී පළවිය. මෙසේ ත්‍රිපිටකය පරිගණක කළවිට පාලි ත්‍රිපිකටය ඉතා කුඩා ඩිස්කටවලට—තැටිවලට අන්තර්ගත කිරීම නිසා මුළු පාලි ත්‍රිපිටකයම ඉතාකුඩා අත්බෑගයක තබාගෙන යාමේ හැකියාවක් ඉතා කෙටිකාලයකදීම උදාවනු ඇත. පිරිවෙන් අධ්‍යාපනයට නව තාක්ෂණයේ උපයෝගිතාව මේ කරුණෙන් වටහාගත හැකිය. ධම්ම පදයේ ඇති සියලුම ගාථා නිරීක්ෂණයකොට විස්තර තාක්ෂණයක් ඇතිකළහොත් එය එක ඩිස්කටයකට ඇතුළත් කළ හැකිය. එමගින් යම් වචනයක්, චිත්ත හෝ නිබ්බාණ වැනි පදයක් කීවරක් ධම්ම පදයේ යෙදී ඇද්දැයි විමසුවහොත් ඊට පිළිතුර තත්පර කීපයකදී කොම්පියුටරය මගින් ලබාදෙයි. මෙබඳු ඩිස්කට—කුඩාතැටි 450 තුළ මුළු ත්‍රිපිටකයම පරිගණකගතකිරීමට හැකිවේයයි ගණන් බලා තිබේ. එබඳු තත්වයක් උඩ යම් පැවිදි ශිෂ්‍යයකු විසින් ත්‍රිපිටකය පරිගණකයෙන් කියවා පාලිපාඨ හැදෑරීමේ හා උපුටාගැනීමේ පහසු මගක් හැටියට පරිගණක විද්‍යාව ඉගෙනීමට අවශ්‍යය යි ඉල්ලීමක් කළවිට එම ඉල්ලීම ඉවතලීමට, කිසියම් කෙනෙකුට පහසු නොවනු ඇත.

බෞද්ධ ආචාරධර්ම පද්ධතියක් පදනම් කොටගෙන බෞද්ධ ජීවන රටාවක් තුළින් ජනතාව පෝෂණය කිරීමට අදල පිරිසක් බිහිකිරීමේ පරමාර්ථය ඇතිව පිරිවෙන් අධ්‍යා

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පනය සකස් කොට ඇතිබව එදා පුළුල් විෂය මාලාවක් තිබූ කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයෙන් පවා පැහැදිලි වේ. පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථය බෞද්ධ දර්ශනය පදනම් කොට ඇතිහෙයින් එහි ප්‍රධාන මූලධර්මයක් වන මධ්‍යමප්‍රතිපදාව අනුව යමින් නූතන පිරිවෙන් අධ්‍යාපනය සකස්කිරීම පිණිස ඉහතදී සැකෙවින් සඳහන් කළ අන්ත දෙකෙන් ආභාෂය ලබමින් මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ පිරිවෙන් අධ්‍යාපනය උදෙසා ප්‍රතිසංවිධානයක් ඇතිකරලීම සඳහා සලකා බැලීම උචිතයයි සිතමි.

අප අදහස් කරන පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මොනවාදැයි සාකච්ඡා කිරීමට පෙර දැනට පවත්නා පිරිවෙන් අධ්‍යාපනය විමසා බැලීම හා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය කෙබඳු රාමුවක් තුළ සකස් කොට ඇත්දැයි සොයා බැලීම අවශ්‍ය-වේ. රටේ පොදු අධ්‍යාපනය ජාතික අධ්‍යාපන මට්ටමෙන් ඔබ්බට ගොස් විශ්ව අධ්‍යාපන රටාවක සමෝධානයක් වියයුතුය යි සමහරු තර්කකරති. මේ අදහස හුදෙක් මනෝ මූලික චින්තනයක් සේ බැහැර කළ නොහැක්කේ දැනට පෙර සඳහන් කළ පරිගණක තාක්ෂණය හා චන්ද්‍රිකා උපයෝගී කරගනිමින් රූපවාහිනී සන්නිවේදනය හා ටෙලිපැක්ස් ක්‍රමය ක්‍රියාවේ යෙදන නිසා එබඳු ක්‍රම මගින් විශ්ව අධ්‍යාපන පද්ධතියක් දියත් කළහොත් සම්පත් ඇති අය ඊට ඇදීයාම වැළැක්විය නොහෙන හෙයිනි. එහෙත් මෙබඳු බලපෑමක් ඇතැයි යන මතය උඩ මෙරටට ජාතික අධ්‍යාපනයක ඇති අවශ්‍යතාව අමතක කළ යුතු නොවේ. වර්තමාන අධ්‍යාපනයට බලපා ඇති මේ කරුණු හා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය සැලකිල්ලට භාජන කරනවිට පිරිවෙන් අධ්‍යාපනය ඉතා පටු තලයක පිහිටා තිබෙන බව පිළිගත යුතුවේ.

1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පණතේ පළමුවැනි පිටුවේ පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු මෙසේ විස්තර කොට ඇත.

2. (අ) භික්ෂූන්වහන්සේලාට, හා

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නාවූද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නාවූද වයස අවුරුදු දහහතර ඉක්මවූ ගිහි, පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණ වන්නේය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ...... කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම

(ආ) ... අවශ්‍ය විනය ත්‍රිපිටකඥානය ධර්ම ගරුකබව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම,

(ඇ) දේශීය හා විදේශීය ධර්ම දූත මෙහෙයෙහි මෙන්ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරතවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණ යක් දීම හා

(ඇ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත, ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබාගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට සුදුසුකම් සලසාදීම පිරිවෙන්. අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ යයි ප්‍රකාශ කොට ඇත. අධ්‍යාපනය සාකච්ඡාවට බඳුන් කිරීමේදී රටක අධ්‍යාපනයේ

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

තිබියයුතු පුළුල් බව හා ප්‍රායෝගික බව විදහා දක්වන අධ්‍යාපන විශාරදයෝ පිරිවෙන් අධ්‍යාපනයේ ඇති පටු ස්වභාවය ඉහත කී පිරිවෙන් අධ්‍යාපන පරමාර්ථ විග්‍රහකරමින් පෙන්වා දෙති.

පිරිවෙන් පරමාර්ථ අතර ඇති භාෂාන්තර හා විෂයාන්තර යන වචන දෙක මෙහිදී අපට පුළුල් ආලෝකයක් ඉදිරිපත් කරන නමුත් එම අර්ථදෙක ක්‍රියාවට නැඟුණේ අල්ප වශයෙනි. එබැවින් තවත් එක් පරමාර්ථයක උපයෝගීතාව බෙහෙවින් දක්නට ලැබේ. එනම්, මෙරටේ සියලු ජන කොටස්වල යහපත සඳහා විශේෂයෙන් බහුතරය වූ සිංහල බෞද්ධ ජනතාවගේ යහපත පිණිස රටේ ආගමික සාමාජික සංස්කෘතික හා ආර්ථික සංවර්ධනය උදෙසා උපදෙස් හා මගපෙන්වා දීම තුළින් සම්පතක් ලෙස සැලකීමට සුදුසු භික්ෂූන් වහන්සේලා පිරිසක් බිහිකිරීම යන අර්ථය ඇති පරමාර්ථයක් එකතු කළ යුතු යයි සිතමි. මේ අදහස විපස්සනාධුරය අනුව කටයුතු කිරීමට කැමති භික්ෂුවට කිසියම් බාධාවක් වියයුතු නොවේ. ජාතික අධ්‍යාපනය වැනි කිසියම් පුළුල් විෂයයක් ගැන පවා සැලසුම් සකස් කිරීමේදී භික්ෂූන් වහන්සේලා බොහෝවිට අධ්‍යාපනයේ ආගමික අංශය, සිංහල ව්‍යාකරණයේ එක අංශයක් හා සිංහල සාහිත්‍යයේ එක් අංශයක් ගැන පමණක් කරුණු ඉදිරිපත් කරන බව පෙනෙන්ට තිබේ. වර්තමානයේ භාවිතයට එන බහු ආගමික සමාජය යන සංකල්පය අනුව බහු පූජකත්වය සමග එකතුව වැඩකිරීමට සිදුවී ඇති බැවින් ගුණයෙන් දැනුමෙන් හා ප්‍රායෝගිකත්ව යෙන් පිරිපුන් භික්ෂූන් වහන්සේලා කීපනමක් හෝ ඇති කරලීමේ අවශ්‍යතාව පිරිවෙන් අධ්‍යාපනය සකස්කරන්නන්ගේ මනසට යොමුවිය යුතු කරුණකි. කෙසේ වුවත් මෑත පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසය තුළ ඇතිවූ වෙනස්කම් හා සංවර්ධනයන් පිළිබඳව සලකා බැලීමේදී 1958 පිරිවෙන් ව්‍යවස්ථා හා 1979 පිරිවෙන් පණතත් පිරිවෙන් ඒකකයක් ඇතිවීමත් සෑහෙන ප්‍රගතියක් වන අතර අසම්පූර්ණ ප්‍රායෝගික බවක් දරන හෙයින් මෙම පිරිවෙන් පණත විසින් ඉදිරිපත් කරන අධ්‍යාපන ව්‍යූහය හා එහි අංග ලක්ෂණ විමසුමට ලක්කර තවදුරටත් පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රතිසංවිධාන ඇතිකර ගැනීම උචිතබව පෙනේ.

එබඳු ප්‍රයත්නයකදී සුලබ කරුණු වන පිරිවෙන් ශිෂ්‍යයා පිරිවෙන් ගුරුවරයා පිරිවෙන් කළමනාකරණය ආදිය ගැන විමසා බැලීමට සිදුවේ. පිරිවෙන් කළමනාකරණය විධිමත් හා ප්‍රාණවත් කරගැනීමට දැනට පවතින තත්ත්වය උපයෝගී කරගත හැකි අතර ශ්‍රද්ධාව හා ආගමික ගෞරවය උඩ පිරිවෙන් කළමනාකරණය හොඳින් සිදුවෙනවා ඇතැයි සිතා කටයුතු කිරීමම ප්‍රමාණවත් නොවේ. එබැවින් සමහර කෘත්‍යාධිකාරීන් වහන්සේලා හා පරිවේණාධිපතීන් වහන්සේලාගේ වුවද නීතිරීති පිළිබඳ අවබෝධය හා කළමනාකරණය පිළිබඳව පුහුණුව, ප්‍රායෝගිකත්වය වර්ධනය කළයුතුව ඇතැයි සිතමි.

සෑම අධ්‍යාපනයක්ම ශිෂ්‍යයා මුල්කොට ගෙන සකස්ව ඇති නමුත් පිරිවෙන් අධ්‍යාපනයට ලැබී ඇති ශිෂ්‍යයා සම්පූර්ණ ශිෂ්‍යයෙකුට වඩා අඩාල ශිෂ්‍යයකු ලෙස පෙනේ. ත්‍රිවිධ චෛත්‍යය ඇති සහසතු ඉඩමක පිහිටුවා ඇති පිරිවෙණ පැවිදි ශිෂ්‍යයා මුල්කරගෙන ගිහි පිරිමි හා පැවිදි යන දෙපක්ෂයට අධ්‍යාපනය දෙයි. 1979 පිරිවෙන් පනත යටතේ ඇති මූලික පිරිවෙන් හා මහා පිරිවෙණ ගිහි ශිෂ්‍යයන් ස්වල්ප දෙනකුටද පිරිවෙන් විද්‍යායතනය මගින් සැලකියයුතු ගිහි ශිෂ්‍ය සංඛ්‍යාවකට ද අධ්‍යාපනය දෙයි. මෙහි ඇති විශේෂ කරුණ නම් මෙම ශිෂ්‍යයා අනිවාර්යයෙන්ම වයස අවුරුදු දාහතර

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

(14) ඉක්මවූ පිරිමි ශිෂ්‍යයකු වියයුතු අතර ඔහු සඳහා 9 වන ශ්‍රෙණියේ සිට පන්ති පැවැත්විය යුතුයයි නීතියෙන් ම නියම කොට තිබීමයි. මෙම නියමය පිරිවෙන දෙස වපර ඇසින් බැලීමක් හා යටත් විජිත යුගයේ සිට පැවතෙන්නක් ද වේ. මේ වයස් නියමය ඉවත්කොට 6 වැනි ශ්‍රෙණියේ සිට ගිහි සිසුන්ට විද්‍යායතන පිරිවෙණේ ඉගෙනීමට සැලැස්වීම යෝග්‍යයයි යෝජනා කළ හැක. විද්‍යායතන පිරිවෙන් වල මිශ්‍රකොට පවත්වන ගිහි පිරිමි පැවිදි පන්ති වෙන් කොට පැවැත්වීමට යෝජනා කොට ඇතිබව අසන්ට ලැබේ. කරුණු විග්‍රහකොට බැලීමේදී පිරිවෙණේ වර්තමාන ගිහි ශිෂ්‍යයා ක්‍රමානුකූල ඍජු අධ්‍යාපනයකින් තොර රජය මගින් පවත්වන කලා විද්‍යා හා වාණිජ අංශවල කිසියම් විභාගයක් හෝ විශ්ව විද්‍යාලයක කලා උපාධි (බාහිර) විභාගයක් සමත්කර ගැනීම සඳහා පැමිණෙන, ශිෂ්‍ය ගුණාංගයන්ගෙන් අඩාල ශිෂ්‍යයෙකු සේ සැලකීමට සිදුවේ. ගිහි ශිෂ්‍යයාගේ ආකල්ප—ඔහුගේ චර්යාවන් මනෝවිද්‍යාත්මක **හැසිරීම්** රටාව හා ඔහුගේ ගෘහ පරිසරය තුළින් උද්ගතවන ගැටළුවලට විසඳුම් ආදිය **තුළින්** වර්ධනයක් ඇති පුද්ගලයන් බිහි කිරීම සඳහා පිරිවෙණට ප්‍රමාණවත් කළමනාකරණයක් ලබා දී නොමැති නමුත් එහි ස්වභාවයෙන් පිහිටා ඇති සංස්කෘතික පසුබිම ශිෂ්‍යයා කෙරෙහි අනගි බලපෑමක් සිදුකෙරේ.

පැවිදි ශිෂ්‍යයා පිරිවෙන් අධ්‍යාපනය තුළ කේන්ද්‍රීය ස්ථානයක් දරණ හෙයින් **මීළඟට පැවිදි ශිෂ්‍යයා** විමසිල්ලට භාජනය කොට බලමු. මූලික පිරිවෙන 1 සිට 5 දක්වා පන්ති පවත්වමින් පැවිදි ශිෂ්‍යයාට අධ්‍යාපනය හා ශික්ෂණය දී පිරිවෙන් අවසාන විභාගයට සූදනම් කරයි. මහ පිරිවෙනේද මූලික පන්ති 5 පවත්වන අතර එහි ඇති විශේෂත්වය නම් එහි ප්‍රාචීන විභාග සඳහා පැවිදි සිසුන් සූදනම් කිරීම හා අ. පො. ස. උසස් පෙළ විභාග සඳහා ගිහි (පිරිමි) පැවිදි සිසුන් පොදුවේ සූදනම් කිරීමයි. මෑතක දී එහි පාලි හා බුද්ධධර්ම ඩිප්ලෝමා පන්ති පැවැත්වීම පිළිබඳව සාකච්ඡා කෙරිණ. විද්‍යායතන පිරිවෙණ ගිහි ශිෂ්‍යයන් පිළිබඳව මීට වෙනස් ප්‍රායෝගික අංශයට බර පාඨමාලා සපයයි. ගිහි ශිෂ්‍යයාගේ එහි මූලික පන්තිය 9 වැනි ශ්‍රෙණියයි. එතැන් සිට ඔහුට අ. පො. ස. සාමාන්‍ය **පෙළ**, අ. පො. ස. උසස් පෙළ කලා විද්‍යා හා වාණිජ අංශද (සමහර විද්‍යායතන පිරිවෙන්වල), විශ්ව විද්‍යාලයවල ප්‍රථම වර්ෂය (බාහිර) හා උපාධි (බාහිර) පන්ති ද පැවැත්වේ. පැවිදි ශිෂ්‍යයාට එහි ප්‍රාචීන විභාග (උපරිමයේ) සඳහාද අ. පො. ස. උසස් පෙළ හා විශ්ව විද්‍යාලය බාහිර උපාධි සඳහා ද ගිහි **(පිරිමි)** සිසුන් සමඟ එක්ව අධ්‍යාපනය ලැබීමට සලස්වා තිබේ. පිරිවෙන් අධ්‍යාපනයේ **මූල** සාධකය වූ පැවිදි ශිෂ්‍යයාගේ ශිෂ්‍ය භාවය ඉතා තී වර්ගීකරණය අනුව කෙබඳු ආකාරයේ කැබලිවලට කැඩී ගොස් ඇද්දැයි විමසීම පවා කනස්සල්ලක් ඇති **කරවන්නකි**.. මෙය පැවිදි ශිෂ්‍යයා ආරක්ෂාකර ගැනීමේ අරමුණින් කරනලද්දක් වුවද පැවිදි ශිෂ්‍යයාට බලපාන්නේ වෙනත් ආකාරයකිනි. මේ නිසා පැවිදි ශිෂ්‍යයා ස්වාධීනව ස්වකීය ගුරුවරයාට හා පිරිවෙනට හොරා තීරණ ගෙන කටයුතු **කිරීමට** යාමෙන් බොහෝ විට **අතරමංවන තත්ත්වයට පත්වීමෙන් ඉක්බිති මුළු සමාජය දෙස ම ද්වේශයෙන් බැලීමට** පෙළඹේ.

පිරිවෙන් පරිපාලනයත් පැවිදි ශිෂ්‍යයාත් අමාරුවට වැටෙන තවත් හේතු කීපයක් ඇත. **පිරිවෙන් පරමාර්ථ තුළ** අනිවාර්‍ය වශයෙන් සඳහන් සමහර විෂයයන් (විෂයයන් කීපයක් අනිවාර්‍ය කිරීම අත්‍ය වශ්‍යවේ) පැවිදි ශිෂ්‍යයා රුචිකරන්නේ නැත. තිත්ත

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කසාය මෙන් ශිෂ්‍යයාට මෙය දීමට යාමෙන් ගැටළු කීපයක් ඇතිවේ. මෙය අධ්‍යාපන විද්‍යාව පවා අනුමත නොකරයි. අනික් වැදගත් කරුණ පැවිදි ශිෂ්‍යයාගේ පන්ති කාමරය සකස්වන ආකාරයයි. අපේ රටේ වසය අවුරුදු 8 සිට විවිධ තරාතිරමේ අය පැවිදි කරනු ලබත්. මූලික පිරිවෙණේ පන්ති 5 අධ්‍යාපනය සාමාන්‍යයෙන් වයස 10 හා 16 අතර වියහැකියයි විශ්වාස කෙරේ. සමහර අවස්ථාවක පළමු ශ්‍රෙණියේ හෝ දෙවැනි ශ්‍රෙණියේදී මේ සියලුම වයස් ප්‍රමාණවල පැවිදි සිසුන් එකම පන්තියට ඇතුළත්ව අධ්‍යාපනය කරණු ලබන බව පෙනේ. මීට ප්‍රධාන හේතුව පැවිදි කිරීමේ වයස් සීමාවේ ඇති පරතරය හා පිරිවෙනට බැඳීමේදී සමහරෙක් ලබා ඇති මූලික දැනීමේ ඇති විශාල අඩුවයි. එසේම ඇතැම් සාමණේර ශිෂ්‍ය නමක් තම වෘද්ධ ගුරුවරයා රැකබලාගෙන සිය ආරාමයේ කටයුතු හා දයක පිරිසගේ ආගමික කටයුතු කරමින් ඉගෙනීම ලබන්නෙකි. තවත් පැවිදි ශිෂ්‍යයෙක් පූර්ණ වගකීමක් ඇති විහාරාධිපති ධූරයක් දරමින් ඉගෙනීම ලබන්නෙකි. මෙබඳු විෂමතා තුළ මේරූ සාමණේර නමගේ ගතිගුණ ආකල්ප චරියාවන් ඉදිරියේ, කුඩා සාමණේර නමගේ ආකල්ප මානසික ස්වභාවය හා චරියාවන්වල ඇති ළපටි මෘදු ස්වභාවය කෘතීමලෙස වෙනස්වීම තුළින් ඇතිවන ගැටළු හේතුකොට ගෙන ඔහුගේ ජීවිතයතුළ ඇතිවන්නේ වේගවත් කලකිරීමකි. මේ අංශයෙන් සලකා බැලීමේදී මූලික පිරිවෙන් පන්ති පහේ පැවිදි සිසුන්, මහාපිරිවෙනේ අ.පො.ස. උසස් පෙළ පන්තියේ සිටින මේරූ පැවිදි සිසුන්ගෙන් වෙන්කර තබා අධ්‍යාපනය දීම වඩා යෝග්‍යයයිද ඒ නිසා පවත්නා පිරිවෙන් වර්ගීකරණය තුළ මූලික පිරිවෙණ යෝග්‍ය යයිද කිව හැක.

මීළඟට ගිහි (පිරිමි) පැවිදි සිසුන් එක්ව එකම පන්තියේ මිශ්‍රව එකට ලබන අධ්‍යාපනය ගැන සලකා බලමු. මහා පිරිවෙණේ අ. පො. ස. උසස් පෙළ පන්තිවල පිරිමි සිසුන් ස්වල්පදෙනෙක්ද විද්‍යායතන පිරිවෙණේ අ. පො. ස. උසස් පෙළ පන්තිවල පිරිමි සිසුන් විශාල වශයෙන් ද එකතුව සකස් වූ පන්තිකාමරයක ගිහි පැවිදි සිසුන්, එක්ව ඉගෙණීම ලබති. පැවිදි ශිෂ්‍යයාගේ ආකල්ප හා පරමාර්ථත් ගිහි ශිෂ්‍යයාගේ ආකල්ප හා පරමාර්ථත් අතර විශාල පරතරයක් ඇති හෙයින් ඈත ඉතිහාසයේ කෙසේ වුවත් මෑත ඉතිහාසයේ මේ එක්ව ලබන අධ්‍යාපනයේ ප්‍රතිඵල දෙපක්ෂයේ ම පරිහානියට හේතුවීයයි පිළිගැනීමට සිදුවී ඇත. තවද මේ ගිහි පැවිදි ශිෂ්‍ය දෙපක්ෂය එකට එක්ව අධ්‍යාපනය ලබන පන්ති කාමරයේ ඇති විවිධ ගැටළු ඉතා බහුල වේ. ආචාර්ය, විෂය ප්‍රශ්නය, විෂයයන් පිළිබඳ රුචි අරුචිකම අනුව ඇතිවන ගැටළු, ඉගැන්වීම කෙරෙහි ඇතිකරන බලපෑම, වයස් සීමාවේ ඇති දුරස්ථතාව ,ඔවුනොවුනගේ ඇති මානසික ස්වභාවයේ බලපෑම්. රැකියාවක් ලබාගැනීමේ අටියෙන් ඉගෙනීම ලබන ගිහි ශිෂ්‍යයාගේ ආකල්ප හා බලපෑම පැවිදි ශිෂ්‍යයා කෙරෙහි දැඩිව ආරෝපනය වීම ආදී ගැටළු ගැන සලකා බැලීමේදී ගිහි (පිරිමි) පැවිදි මිශ්‍ර අධ්‍යාපනය හොඳට වඩා නරක අතට ගමන්කර ඇතිබව පෙනෙන අතර මේ ගැටළු ස්වභාවයම වර්තමාන පිරිවෙණ් අධ්‍යාපනය අඩාලවීමට හේතු වීයයි ද පෙනීයයි. මේ තත්ත්වය විමසා බලා පිරිවෙන් අධ්‍යාපනය ප්‍රගතියකරා යොමුකිරීමේ අටියෙන් යම් යම් ප්‍රති සංවිධාන ඇතිකර දීමේ වැදගත්කම පෙන්වා දියයුතු අතර මෑත කාලයේ පිරිවෙන් අධ්‍යාපනය තුළින් තමන්ගේ අර්ථ සිද්ධිය ඇතිකරගෙන සමාජයට යහපතක් සිද්ධකරන අතිවිශාල ගිහි පැවිදි ආදි සිසුනගේ සේවාවද අමතක කළයුතු නො වේ.

ගුරුවරයා කවර අධ්‍යාපනයක වුවද දක්වන ප්‍රමුඛතාව කිසියම් කරුණකට දෙවෙනි නොවේ. පිරිවෙන් ගුරුවරයාගේ කාර්ය භාරය මීලඟට සලකා බලමු. පිරිවෙන්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ගුරුවරයාගේ රැකියාව පිරිවෙන් ශිෂ්‍යයාගේ පැමිණීමේ ඒකකය උඩ රඳා පවතින නිසා පිරිවෙන් ගුරුවරයා නිරන්තරයෙන් අස්ථාවරත්වයකින් පසුවෙයි. පිරිවෙන් අධ්‍යාපනය කෙරෙහිද පිරිවෙන් කළමනාකරණය කෙරෙහිද බලපා පිරිවෙන් අධ්‍යාපනය දුර්වලවීමට මෙය හේතුවක් බැවින් පිරිවෙන් ගුරුවරයා ස්ථාවරත්වයකට ගෙනඒමට කටයුතු කිරීම අවශ්‍යව තිබේ. පිරිවෙනේ පැවිදි ගුරුවරයා අධ්‍යාපන අංශයෙන් මෙන් ම ගුණාත්මක අංශයෙන් ද දෙන පෝෂණය විශේෂත්වයකින් යුතුව සටහන් වේ. පිරිවෙනේ ගුරුවරුන්ගෙන් වැඩිදෙනෙක් උපාධිධාරි නුපුහුණු ගුරුවරු වෙති. මූලික හා මහාපිරිවෙන්වල සේවය කරන ගුරුවරුන්ගෙන් ස්වල්ප දෙනෙක් පුහුණු ගුරුවරුන් වුවත් එම ගුරුපුහුණුවේ නොයෙක් ඌනතා ඇති බැවින් එම පුහුණුව රජයේ ගුරු පුහුණුව හා සමකළ නො හැක. පිරිවෙන් විද්‍යායතනවල බහුල වශයෙන් උපාධිධාරී ගුරුවරු සේවය කරති. සමස්තයක් වශයෙන් ගත් කල මුළු පිරිවෙන් ගුරු සංඛ්‍යාවෙන් විශාල පිරිසක් නුපුහුණු ගුරුවරුන් වන අතර, රටේ මුළු ගුරු සංඛ්‍යාව වූ 1,80,000 අතුරෙන් නුපුහුණු ගුරුවරුන් සියයට 55 පමණ වේයයි ගණන් බැලූ වොත් එයින් නුපුහුණු ගුරුවරුන්ගේ වැඩිම ප්‍රතිශතකය ඇත්තේ පිරිවෙන් ගුරුවරුන් අතරය මේ නුපුහුණු ගුරුවරුන් පුහුණු ගුරුවරුන් කරගැනීමේ අවශ්‍යතාව එම ගුරුවරුනට හා වගකිවයුත්තන්ට පැවරී ඇති වග කීමකි. විශ්ව විද්‍යාලවල ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා තුළින් ස්වල්ප දෙනකුට වුවද අතදීම වැදගති. ගුරු පුහුණුව හුදෙක් කාර්‍යක්ෂමතා කඩඉම පසුකර ගැනීමට පමණක් නොව, පූර්ණ වැඩදයි ගුරුසේවයක් කිරීමට ද එය ඉතා අවශ්‍ය උපකරණයකි. පසුගිය කාලයේ පිරි වෙන් සිසුන් අතර කැපීපෙනෙන අසතුටුදයක වර්ධනයක් ඇතිවූයේ නුපුහුණු ගුරු සේවය එක් හේතුවක් නිසායයි තතු දත් අය දනිති.

ගුරුවෘත්තිය පුහුණු වූ ගුරුවරයාටම අයත් වෘත්තියක් හෙයින් සෑම ගුරුවරයෙක්ම පුහුණු ගුරුවරයෙක් වීම සමාජ සුහසිද්ධියට අතිශයින් අදාලවේ. ඉහත සඳහන්වූද සඳහන් නොවූද කරුණු විමසිල්ලට භාජනයකොට වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය ප්‍රතිසංවිධානය සඳහා සැලසුම් සකස් කිරීමේදී පහත සඳහන් අදහසද සැලකිල්ලට භාජන කිරීම සඳහා ඉදිරිපත් කරමි.

දනට ඇති පිරිවෙන්වල සහාය ලබාගෙන යම් පරිවර්තන කාලයක් තුළ ඒ ඒ දිස්ත්‍රික්කවල පැවිදි ශිෂ්‍යයන් සඳහා පමණක් දිස්ත්‍රික්කයේ පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කේන්ද්‍රිය හෝ මධ්‍යම පිරිවෙන් ඇතිකිරීම යෝග්‍යයයි යෝජනා කරමි. එක කේන්ද්‍රිය පිරිවෙණකට පැවිදි සිසුන් 100 ක් පමණ ප්‍රමාණවත් වේ. මේ සඳහා දනට පවත්නා පිරිවෙන්, පරිත්‍යාගශීලීන් පිරිනමන ගොඩනැගිලි, විහාර දේවාල භාරයන් සතු ගොඩනැගිලි හා රජයෙන් ලබාගන්නා ගොඩනැගිලි යොදගැනීමට වැඩ පිළිවෙලක් යොදගත හැක. පිරිවෙන් වල ගිහි සිසුන් සඳහා දනට පවත්නා පිරිවෙන් විද්‍යායතනවලින් යෝග්‍ය ප්‍රමාණයක් තෝරාගෙන 6 වැනි ශ්‍රේණියේ සිට පොදු අධ්‍යාපනය පුළුල් අන්දමින් පවත්වාගෙන යාමට කටයුතු කළහැක. පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ වියයුත්තේ පැවිදි සිසුන්ගේ අධ්‍යාපනය ක්‍රමවත් කර ගැනීමයි. ඉහත කී කේන්ද්‍රීය පිරිවෙණ හෝ මධ්‍යම පිරිවෙන ඒක පුද්ගල පාලන යෙන් තොර රජයේ සම්බන්ධයඇති මණ්ඩලයක් මගින් පාලනය කිරීමට සැලැස්වීම අවශ්‍යවේ. කේන්ද්‍රිය හෝ මධ්‍යම පිරිවෙණ, මූලික හා උපරිම හෝ කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වශයෙන් අංශ දෙකකින් යුක්තවිය යුතුවේ. කණිෂ්ඨ අංශය වර්ෂ 6 ක් වනසේද ජ්‍යෙෂ්ඨ අංශය වර්ෂ 5 ක් වනසේද වෙන්කර ඉතා පුළුල් විෂය මාලාවක් අන්තර්ගත

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කොට අධ්‍යාපනය සකස්කළ යුතුවේ. එහි දැනට රටේ පවත්නා කිසියම් විභාගයක් එල්ලකරගෙන පන්ති නොපවත්වන නමුත් කැමති ශිෂ්‍යයකුට මේ දැනීම ආධාරකොට ගෙන කැමති විභාගයක් සමත් කර ගැනීමට පහසුවෙන් හැකි වේ. මෙම කේන්ද්‍රිය පිරිවෙණ මගින් කනිෂ්ඨ **පිරිවෙණ** අවසානයේදී සුදුසු ඩිප්ලෝමා සහතිකයක් හා උත්තර **පිරිවෙණ** අවසානයේදී උපාධියක් පිරිනැමීමට කටයුතු කළයුතු වේ. මෙම කේන්ද්‍රිය පිරිවෙන නේවාසික එකක් මෙන්ම අළුයම 5 සිට රාත්‍රී 10 දක්වා වූ කාල සටහනක් අනුව ශිෂ්‍යයන් 15 කට එක්කෙනා බැගින් වූ ධර්මාචාර්ය වරුන්ගේ අධීක්ෂණය යටතේ දිනකට පැය 8 ක පමණ අධ්‍යාපනයක් ඇති පැය 5 පමණ වතාවත්, බණ. භාවනා ආදී ප්‍රායෝගික වැඩ මාලාවක් ඇතිව ප්‍රතිෂ්ඨාපනය කළයුතුවේ. දැනුම් හා වයස් සීමාව සමතලයේ ඇති පැවිදි සිසුන් ඒ ඒ පන්ති වලට පරීක්ෂණ මගින් තෝරා ගතයුතුවේ. මෙම ආයතන දේශපාලන බලපෑම්, ප්‍රදර්ශණ භාණ්ඩ වශයෙන් යොදගැනීම සහ ප්‍රචාරක ආගමික උත්සව වලින්ද තොරව හුදෙක් නිදහස් පරිසරයක තබාගැනීම අවශ්‍ය වේ.

විෂය මාලාව :—

* සිංහල, පාලි සංස්කෘත, ඉංග්‍රීසි, දෙමළ, හිංදි හා ජපන්, ජර්මන්, ප්‍රංශ හා රුසියන් භාෂා

* බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ඨාචාරය, බෞද්ධ දර්ශණය, පෙරදිග දර්ශණය, මහා යාන හා වජ්‍රයාන දර්ශණ, තර්කන්‍යාය, කාව්‍ය නාට්‍ය හා රසවාද, ඉතිහාස පුරාවිද්‍යා, භූගෝල විද්‍යා, සමාජ විද්‍යා, අධ්‍යාපන විද්‍යා, ස්වස්ථතාව, ජනසංනි වේදනය, ව්‍යවහාර නීතිය

* ගණිතය, ගණකාධිකරණය, යතුරු ලියනය. පරිගණක තාක්ෂණය. කළමනා කරණය,

* භෞතික විද්‍යා, රසායන විද්‍යා, තෘණ විද්‍යා (සාමාන්‍යයෙන්)

ප්‍රායෝගික අංශය :—

බෞද්ධ වන්දනා, වතාවත්. බණදහම් හා පිරිත් **දේශන** පුහුණුව. ගුරු පුහුණුව, බෞද්ධ හා යෝගී ආසන, භාවනා පුහුණුව.

මෙම සමහර විෂයයන් පිළිබඳ සාමාන්‍ය දැනීමක් අපේක්ෂා කෙරේ. යම් විෂය යක් පිළිබඳ ස්ථාවර භාවයක් තබාගැනීම සඳහා සිසුන් හා ගුරුවරුන් හුවමාරුකර ගැනීමේ වැඩ පිළිවෙලක් අවශ්‍ය වේ. කණිෂ්ඨ අංශයේ දීසියලුම විෂයයන්ද උත්තර අංශයේදී දක්ෂතාව අනුව තේරුණු ප්‍රධාන **විෂයන්ගෙන්** තුනකට වැඩි ගණනක්ද හදරා විශේෂ විෂය දැනීමක් ලබාදිය යුතුවේ.

මූල්‍ය ප්‍රතිපාදන, සම්පත් හා කලමනාකරණය:

**පිරිවෙන් ප්‍රතිසංවිධානය කිරීම** නිසා ඉතිරිවන මුදල් හෝ රජයෙන් ලබාගන්නා මුදල් හා වෙනත් දේ, බෞද්ධ කොමසාරිස් තුමාගෙන් ලබාගන්නා මුදල් හා වස්තු. විහාරය හා දේවාලය වලින් සහ භාරවලින් ලබාගන්නා මුදල් හා සම්පත් පළාත්

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

සභාවලින් ලබාගන්නා මුදල් සම්පත්, දේශීය හා විදේශීය පරිත්‍යාග ශීලින්ගෙන් ලබා ගන්නා මුදල් හා **සම්පත්** සහ වෙනත් මාර්ගවලින් ලැබෙන ආධාර උපයෝගී කරගෙන මෙම කේන්ද්‍රිය පිරිවෙන් දිස්ත්‍රික්කයේ පැවිදි ශිෂ්‍ය අනුපාතය අනුව ප්‍රතිෂ්ඨාපනය කළයුතුවේ. මෙම කේන්ද්‍රිය පිරිවෙන් ආයතනය මැනවින් සැලසුම් කොට පිහිටුවා කලක් හොඳ තත්වයෙන් පවත්වාගෙන ගියහොත් ඒ අනුව පළාත් සභාව විසින් මෙම ආයතන පවත්වාගෙන යාමට ඉදිරිපත් වීමට ඉඩ ඇත.

**පිරිවෙන් ඒකකය විසින් කැඳවනු ලබන ස්වාධීන මණ්ඩලයක් මගින් තීරණය කළයුතු කරුණු**

පිහිටවියයුතු මධ්‍යම පිරිවෙන් සංඛ්‍යාව හා ස්ථාන, මූල්‍ය හා වෙනත් දේ ලබා ගන්නා ආකාරය.

පැවිදි සිසුන් ඇතුළත් කරගතයුතු සංඛ්‍යාව හා ඇතුළත් කිරීමේ පිළිවෙල. එම සිසුන්ට අධ්‍යාපනය හා සියලු පහසුකම් නොමිලයේ සැපයීම.

ගුරුවරුන්, ධර්මාචාර්යවරුන් හා නිලධාරීන් හා සේවක මණ්ඩල පත්කිරීම හා සේවා කොන්දේසි.

ගුරුවරුන්ට හා ධර්මාචාර්යවරුන්ට වැටුපට අමතරව ඔවුනගේ සේවය අනුව අතිරේක දීමනාවක් පිරිනැමීම අවශ්‍ය වේ. මෙයින් වැඩිකොටසක් පිරිවෙන් අධ්‍යාපනය ප්‍රතිසංවිධානය තුළින් ඉටුකර ගැනීමට හැකිවේයයි සිතමි.

පිරිවෙන් මණ්ඩලයේ කාර්ය පටිපාටිය අනුව එය උපදේශක මණ්ඩලයක්ද විධායක බලය ඇති මණ්ඩලයක්ද යන්න පැහැදිලි නැත. කෙසේ වුවත් වර්තමාන පිරිවෙන් උපදේශක මණ්ඩලය බෙහෙවින් අකාර්යක්ෂම එකක් බව කිවයුතුය. ගෞරවය හා **සාම්ප්‍රදායික නායකත්වය** පදනම්කොට ඇති **මණ්ඩලය** මගින්. මෙබඳු ගැටළුවලින් ගහණ තීරණකර අභියෝගයන්ට මුහුණපාන .පුළුල් කාර්යයක් **අර්ථවත්ව** කරගත හැකි නොවේ. ඒ සඳහා පුළුල් දැනීම හා අත් දැකීම් ඇති කාර්යක්ෂම පුද්ගලයන්ගෙන් යුත් මණ්ඩලයක් අවශ්‍යවේ. එබැවින් දනට ඇති පිරිවෙන් මණ්ඩලය ඉවත්කොට නිකායත්‍රයට අයත් භික්ෂූන් වහන්සේලාගේ මූලස්ථානවල හා බෞද්ධ සමිති සමාගම්වල සහයෝගය ලබාගෙන කාර්යක්ෂම පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයක් පිරිවෙන් ඒකකයට **අනුයුක්ත කොට පිහිටවිය යුතුවේ**. . මේ ලිපියේ අදහස් උනන්දුවක් දක්වන නන්ගේ හා වගකිවයුත්තන්ගේ අවධානයට යොමුවනු ඇතැයි සිතමි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk